# ඔන්චිලි වාරම් කවි

පුරවර මැද බැඳි රන් ඔංචිල්ලා
දුර යන තරමට පුදුම නොවෙල්ලා
වැර සර පිරිමින් තව පැදපල්ලා
සුරපුර දෙවියනි රකු මෙ සියල්ලා

අටදෙන අට කොන වාඩි වෙයල්ලා
සිටගෙන දෙදෙනෙක් පොලු පාගල්ලා
වවුලන් ලෙස කැරකෙන ඔංචිල්ලා
අපිත් පදිමු මේ රන් ඔංචිල්ලා

.dhkd

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

# චාමර කවි ගායනා

සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට
බසිමින් චාමර ගත්තේ සුරතට
ගනිමින් චාමර සැලුවේ මුනිඳුට
අපි දූන් දක්වමු ඒ රඟ සබයට

ජය ජය සිංහ නරේන්ද්‍ර - රක්ෂ රක්ෂ ජය ජය සිංහ සුරේන්ද්‍රා
ජය ජය සිංහ සුරේන්ද්‍ර - රාක්ෂ රාක්ෂ ජය ජය කන්ද සුරින්දා

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)